ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 අප්‍රේල් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 17 දින ද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ලග්ගල - පල්ලේගම ප්‍රදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(ආ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.4,093,098 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු සොයා බලා නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ii) | ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට රු.3,315,257 ක් හරකර තිබීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (iii) | 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.1,313,849 ක වටිනාකමක් සහිත භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. ගබඩා අත්තිකාරම් ක්‍රමය 2019 වර්ෂයේ සිට නිසි පරිදි අනුගමනය කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2018 වර්ෂය තුළ නිකුත් කරන ලද භාණ්ඩ ගබඩා නිකුත් කිරීම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. ගබඩා අත්තිකාරම් ක්‍රමය 2019 වර්ෂයේ සිට නිසි පරිදි අනුගමනය කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (v) | 2018 දෙසැම්බර් 31 දිනට රු.126,113 ක් වටිනා ගබඩා භාණ්ඩ අවසන් තොගයට ගෙන නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (vi) | යතුරු පැදි දෙකක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | මෙම වත්කම් තක්සේරු කිරීමට කමිටුවක් පත්කර ඇත. |
| (vii) | සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත දෙකකට අදාළව රඳවාගන්නා ලද රු.130,000 ක වටිනාකමක් අතුරුදවුම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේදී අත්තිකාරම් ගිණුමේ රු.156,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (ix) | 2018 වර්ෂයේදී සභාව වෙත පවරාදෙන ලද රු.2,182,503 ක් වටිනා හත්තොටඅමුණ පොළ ගොඩනැගිල්ල ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (x) | කළුගඟ ව්‍යාපෘතියට (ජලාශයට) යටවී ඇති කඩ කාමර, පොදු වෙළඳපළ, පෙර පාසල් ගොඩනැගිල්ල, කසළ අංගනය සහ මහජන පුස්තකාලය ඇතුළු ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන නිසි පරිදි පවත්වා ගත යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |
| (xi) | 2018 වර්ෂයේ දෙසැම්බර් 29 දින ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබුණු භාණ්ඩ 05 ක වටිනාකම වූ රු.599,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.8,805,934 ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.3,841,871 ක අසමානතාවයක් විය. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | තවදුරටත් පසුගිය වර්ෂවල ශේෂයන් සමඟ සසඳා නිවැරදි කරමි. |
| (ii) | වෙනත් ආදායම් ලේඛනයේ සඳහන් ආදායම් ප්‍රභවයන් හා ගිණුම්ගත කර තිබුණු වටිනාකම් අතර රු.57,614 ක වෙනස්කම් විය. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදිව ප්‍රා.ස ලේඛන සකස් කර නිවැරදි අයශීර්ෂ භාවිතා කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.1,836,420 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.1,719,801 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුමට වැරදි ලෙස සිදුකළ ගැළපීම් නිවැරදි කර අවිනිශ්චිත ගිණුම ඉවත් කළ යුතු වේ. | පිළිගනිමි. 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කරමි. |

(ඉ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) ලැබිය යුතු ගිණුම් | | |
| වසර ගණනාවක සිට දිගින් දිගටම පවතින හිඟ ආදායම් ශේෂ 03 ක එකතුව රු.160,724 ක් විය. | අනෙකුත් ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. | හිඟ අක්කර බදු ශේෂය කපා හැරීමටත් අනිකුත් ශේෂයන් සොයාබලා නිවැරදි කිරීමටත් කටයුතු කරමි. |
| (ii) ගෙවිය යුතු ගිණුම් | | |
| වසර ගණනාවක සිට දිගින් දිගටම පැවත එන ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතුව වූ රු.2,050,729 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | ගෙවිය යුතු විශ්‍රාම වැටුප් ශේෂය නිරවුල් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් යෙදීමටත් අනෙකුත් ශේෂයක් සම්බන්ධයෙන් සොයබලා නිරවුල් කිරීමටත් කටයුතු කරමි. |

(ඊ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.17,099,485 ක් වූ ගිණුම් විෂයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගත් මාර්ග ගැසට් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | 371(2) | 2015, 2016 හා 2018 වර්ෂවලදී අවස්ථා 13 කදී නිලධාරින් 13 දෙනෙකුට ලබාදී තිබුණු අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පියවා නොතිබුණි. | ලබාදෙන ලද අතුරු අග්‍රිම පියවීම කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | i. රීති අංක 99 | 2018 වර්ෂයේ අවස්ථා 04 කදී සහතික නොකළ වවුචර්වලට ගෙවීම් කර තිබුණි. | නිසි පරිදි සහතික කළ වවුචර් පත්‍ර සඳහා පමණක් ගෙවීම් සිදු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| | ii. රීති අංක 217 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස් 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණි. | පී.එස්.46 ආකෘති ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් පවත්වා ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඈ) | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොතිබුණි. | ඇඟිලි සළකුණු යන්ත්‍ර මඟින් පැමිණීම පිටවීම සනාථ කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | සෑම මාස 12 කට හෝ කිලෝමීටර් 25000 ක් ධාවනය කිරීමෙන් අනතුරුව වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත් ආයතන සතු වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාවන් සුදුසු කාලසීමාවේදී සිදු කළ යුතු වේ. | කඩිනමින් ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකිරීමට කටයුතු කරමි. |

1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නිදහස් කිරීම සඳහා වන දින 10 ක පුහුණු වැඩමුළුවට සහභාගී වීම වෙනුවෙන් වැඩබලන සභා ලේකම්වරයාට ගමන් වියදම් හා සංයුක්ත දීමනා වශයෙන් රු.10,820 ක මුදලක් ගෙවා තිබුණි. | ගමන් වියදම් හා සංයුක්ත දීමනා නිසි තහවුරුවකින් පසුව ගෙවීය යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.659,500 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.74,906 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජංගම ගිණුම් දෙකකට අදාළව පිළිවෙළින් රු.114,950 ක් හා රු.220 ක් 2012 වර්ෂයේ සිට කිසිදු ගනුදෙනුවකින් තොරව පවත්වාගෙන ගොස් තිබුණි. | සක්‍රිය ගිණුමකට මාරු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිග ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිග ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,260 | 58,900 | 43,808 | 1,223,353 | 220,260 | 22,000 | 22,000 | - |
| කුලී | 365,600 | 54,790 | 64,145 | 296,723 | 255,600 | 116,440 | 116,440 | 171,200 |
| බලපත්‍ර ගාස්තු | 740,000 | 334,500 | 344,500 | - | 800,000 | 602,200 | 368,200 | - |
| වෙනත් ආදායම් | 3,960,000 | 2,607,305 | 1,797,107 | 810,198 | 5,597,750 | 3,051,477 | 2,251,477 | 1,188,334 |
| එකතුව | 5,080,860 | 3,055,495 | 2,249,560 | 2,330,274 | 6,873,610 | 3,792,117 | 2,758,117 | 1,359,534 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 06 කට පෙර සිට ඉදිරියට ගෙනඑමින් පවතින හිඟහිටි අක්කර බදු ශේෂය රු.64,426 ක් වූ අතර එම ශේෂය නිරවුල් කරගැනීමට පියවරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කළ යුතු වේ. | මෙම හිඟ මුදල් සම්බන්ධයෙන් නිසි තොරතුරු සොයාගත නොහැකි බැවින් එම මුදල් කපාහැරීමේ කටයුතු කරමි. |

### 2.3.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ කඩ කුලී හා නිවාස කුලී රු.118,940 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ශේෂ අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ට්‍රැක්ටර් කුලී රු.177,783 ක් අයවිය යුතුව තිබුණි. | හිග ශේෂ අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

### 2.3.4 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ජල සම්බන්ධතා ගාස්තු රු.231,897 ක් ශේෂයක් වර්ෂ ගණනාවක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | කළුගඟ ව්‍යාපෘතිය නිසා ඇතැම් රාජ්‍ය ආයතන හා පුද්ගලයන් සභා බල ප්‍රදේශයෙන් ඉවත්ව යාමත් සමඟ අයකරගත යුතුව තිබුණු හිඟ ජල ගාස්තු රු.630,342 ක් වූ අතර | හිඟ ශේෂ අයකර ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

ඉන් රු.528,100 ක මුදලක් රාජ්‍ය ආයතනවලින් අයවීමට තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 17 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් අනෙකුත් කරුණු සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභාවේ කටයුතු සම්බන්ධයෙන් සුදුසු පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම කළ යුතු වේ. | අඩුපාඩුව පිළිගෙන ඇත. ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරමි. |

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම වෙනුවෙන් රු.909,714 ක වියදමක් දරා තිබුණ ද කසළ නිසි කළමනාකරණයකින් තොරව රජයේ ඉඩමකට දිනපතා බැහැර කරමින් පැවතුණි. | කසළ බැහැර කිරීම නිසි කළමනාකරණකින් යුතුව සිදු කළ යුතු වේ. | විධිමත් ලෙස කසළ කළමනාකරණයට කටයුතු කරමි. |
| (ii) | 2018 ජූනි 06 දිනැති මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ලිපිය අනුව බැහැර කිරීම හා ඒ සඳහා ජනතාවගේ සහභාගීත්වය ලබාගන්නා ලෙස දැනුම් දී තිබුණ ද දිනපතා එකතුවන කසළ තේරීම හෝ වෙන් කිරීම සිදුකර නොතිබුණු අතර පොලිතින් අපද්‍රව්‍ය පිළිස්සීම හා වළ දැමීම සිදුකර තිබුණි. | දීර්ඝ කාලීන කසළ කළමනාකරණ ව්‍යාපෘතියකට සභාව විසින් යොමු කළ යුතු වේ. | විධිමත් කසළ කළමනාකරණයකට අදාළ ව්‍යාපෘති ඇති කිරීම සඳහා ප්‍රමාණවත් ආදායම් සභාවට නොමැති අතර මහවැලි අධිකාරිය මඟින් ඉහත ව්‍යාපෘති ලබාදීමට කටයුතු සිදුකරමින් පවතී. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කැබ්රථයක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2016 ජනවාරි මාසයේදී ප්‍රාදේශීය සභාව වෙත ලැබුණු රු.134,370 ක මුදලක් අලුත්වැඩියා කළ ආයතනයට ගෙවීම් නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | අදාළ මුදල සුදුසු පරිදි සභාවේ ආදායමට ගත යුතු වේ. | මෙම රථයේ අලුත්වැඩියාව නිසි පරිදි සිදුවී නොමැති බැවින් මෙම මුදල ගෙවීමට නොහැකිවී ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර තිබූ හත්තොටඅමුණ පොළ ගොඩනැගිල්ල ටෙන්ඩර් කර සුදුසු පුද්ගලයන්ට ලබාදී නොතිබුණි. | ප්‍රයෝජනයට නොගන්නා වත්කම් ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු පරිදි ආදායම් උපයා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ඇ) | පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගාසිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන (2016) යටතේ රු.800,000 ක වියදමකින් පිටවල සමනල ක්‍රීඩාංගනයේ යටිතල පහසුකම් නගාසිටුවීමට කටයුතු කර ඇතත් භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රයෝජනයට නොගන්නා වත්කම් ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගත යුතු වේ. | මෙම උද්‍යානය මහජනතාවට භාවිතා කළහැකි වන පරිදි සංවර්ධනය කරන බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්තතා | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්යමණ්ඩල පුරප්පාඩු 19 ක් විය. | කාර්යමණ්ඩල ඌනතා සම්පූර්ණ කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | ප්‍රාදේශීය සභාවේ හිටපු ලේකම්වරයෙකු විසින් අල්ලස් ලබාගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් චෝදනාපත්‍ර ගොනුකර | විනය පරීක්ෂණ කඩිනම් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

| | | |
|---|---|---|
| ලේකම්වරයාගෙන් 2018 අප්‍රේල් 23 දින පිළිතුරු ලබාගෙන ඇතැත් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | | |

(ඇ) සේවක ඇප
--------------

| | | |
|---|---|---|
| 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සිඑස්/06/06/02 දරන ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ නිලධාරින් 04 දෙනෙකු ඇප තබා නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.4 වත්කම් කළමනාකරණය
-----------------------------

3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම
-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතුව පවතින ඉඩම් ගොඩනැගිලි, වාහන හා යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ ඇතුළු වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දක්වා ඇති වත්කම් සම්බන්ධයෙන් වත්කම් ලේඛන පවත්වා ගත යුතු වේ. | සභාවට අයත් වත්කම් හා දේපළ සම්බන්ධ තොරතුරු සම්පූර්ණ කරගත් විගස වත්කම් ලේඛනගත කිරීමට කටයුතු කරමි. |

3.4.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබානොගැනීම
------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.2,182,502 ක ගිවිසුම්ගත වටිනාකමකට ඉදිකර තිබූ ලග්ගල-පල්ලේගම සතිපොළ ගොඩනැගිල්ල විධිමත් පරිදි භාවිතා කර අදායම් උපයාගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ගොඩනැගිල්ල සභාවේ ආදායම් උත්පාදන කටයුතුවලට භාවිතා කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.4.3 පවරා නොගත් වත්කම්
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහවැලි සංවර්ධන අධිකාරියෙන් ලබාදී ඇති ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල හා නිල නිවාස පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු පරිදි අදාළ ඉඩම් හා ගොඩනැගිලි සභාවට පවරා ගැනීමට හා වත්කම් ලේඛනවලට ඇතුළත් කළ යුතු වේ. | ගොඩනැගිල්ලේ පවතින අඩුපාඩු සකස් කරගැනීමෙන් අනතුරුව පවරා ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සුසාන භූමි, මහජන පුස්තකාල හා ප්‍රජාශාලා ගොඩනැගිලි පිහිටි ඉඩම් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | සුදුසු පරිදි අදාළ ඉඩම් හා ගොඩනැගිලි සභාවට පවරා ගැනීමට හා වත්කම් ලේඛනවලට ඇතුළත් කළ යුතු වේ. | මෙම ගොඩනැගිලි පිහිටි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට මහවැලි අධිකාරිය සමඟ සාකච්ඡා කර ඇත. |
| (ඇ) | සභාව භාවිතා කරන වාහන 07 ක් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන සභාව වෙත පවරා ගත යුතු වේ. | මෙම වාහන පවරා ගැනීමට කටයුතු කරමි. |

3.4.4 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | DM 20 KW විදුලි ජනන යන්ත්‍රය සහ බ්ලොක් ගල් කපන යන්ත්‍රය වර්ෂ ගණනාවක සිට භාවිතයට ගෙන නොතිබුණි. | ප්‍රයෝජනයට නොගන්නා වත්කම් ඉවත් කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගත යුතු වේ. | මෙම යන්ත්‍රය වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර තක්සේරු වාර්තා ලැබීමෙන් පසු වෙන්දේසි කරන බව දන්වමි. |
| (ආ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව සභාව වෙත ලබාදී තිබුණු රු.7,967,144 ක් වටිනා මාර්ග තලන යන්ත්‍රය 2017 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොතිබුණි. | අලුත්වැඩියා සිදු කර භාවිතයට ගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | සභාව සතු වාහන දෙකක් දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | වාහන සුදුසු පරිදි අලුත්වැඩියා කිරීම හෝ ඉවත් කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.4.5 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු කැබ් රථ 02 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | වාහන ආදායම් බලපත්‍ර ලබා ගත යුතු වේ. | ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විශේෂ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ පොල් පැළ හා පැපොල් පැළ බෙදාදීම සඳහා පුද්ගලයන් 154 දෙනෙකුට පොල් පැළ 10 ක් හා පැපොල් පැළ 24 බැගින් බෙදා දී තිබුණ බව දන්වා තිබුණ ද සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී බොහෝ පුද්ගලයන්ට ලැබී තිබුණේ පැපොල් පැළ 10 කට අඩු සංඛ්‍යාවක් විය. බෙදාදුන් පැළ ගුණාත්මක තත්ත්වයකින් තොරවීම නිසා පැළ 2500 ක් විනාශ වී තිබුණි. එබැවින් මේ සඳහා දරන ලද රු.251,600 ක මුදල ඵලදායි වී නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයට සුදුසු පරිදි තෝරා ගැනීම හා ඒ සම්බන්ධව පසුවිපරම් සිදු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.6 ප්‍රසම්පාදනය

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තිය ප්‍රකාරව සභාව විසින් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ රු.922,004 ක මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව මිලදී ගෙන තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීම හා ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන ඒකකය නිසි ක්‍රියාකාරිත්වයෙන් යුතුව පවත්වා ගත යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවද 2018 වර්ෂය තුළ කමිටුවාර 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීම කළ යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |